## ගොබ් ඉරුදින | දේව ප්‍රකාශන | 24-03-13

### ගොබ් ආසිරි ගැන්වීම

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය. ලූක් 19:28-40

උන් වහන්සේ මෙවදන් දෙසා ජෙරුසලමට යන පිණිස ඔවුන්ට පෙරටුව වැඩි සේක. උන් වහන්සේ ඔලීව නම් කන්දට නුදුරු බෙත්පාගයට ද බෙතානියට ද ළං වූ කල, සිය ශ්‍රාවකයන්ගෙන් දෙදෙනකු යවමින්, "ඔබ ඉදිරිපිට තිබෙන ගමට යන්න. එහි ඇතුළු වූ විට, කිසි කලෙක කිසිවෙකු නොනැගුණු කොටළු නාම්බෙකු බැඳ සිටිනු ඔබට සම්බවන්නේ ය. ඌ ලිහා මෙහි ගෙනෙන්න. ඌ ලිහන්නේ මන්ද යි යමෙකු ඇසුවොත්, සමිඳුණන් වහන්සේ හට උගෙන් වැඩක් ඇතැ යි කියන්නැ"යි වදාළ සේක. යවනු ලැබුවෝ ගොස් උන් වහන්සේ ඔවුන්ට වදාළ ලෙස ම දුටුවෝ ය. ඔවුන් කොටළු නාම්බා ලිහන කල අයිතිකාරයෝ "ඔබ කොටළු නාම්බා ලිහන්නේ මන්ද"යි ඇසූ හ. "සමිඳුණන් වහන්සේ හට උගෙන් වැඩක් ඇතැ"යි ඔව්හු කී හ. ඔව්හු කොටළු නාම්බා උන් වහන්සේ වෙත ගෙනවුත්, තමන්ගේ උතුරු සළු ඌ පිට අතුරා, ජේසුස් වහන්සේ ඌ පිට හිඳවූ හ. උන් වහන්සේ යද්දී, ඔව්හු තමන්ගේ උතුරු සළු මග එලා ලූ හ. උන් වහන්සේ ඔලීව කන්දේ බෑවුම ළඟට පැමිණි කල්හි, මුළු ශ්‍රාවක සමූහයා ප්‍රීති වන්නටත් තමන් දුටු සියලු ප්‍රබල ක්‍රියා ගැන මහත් ශබ්දයකින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන්නටත් පටන් ගෙන, "සමිඳුන් නමින් වඩිනා රජුට ආසිරි වේ වා! ස්වර්ගයෙහි සාමය ද අති උසස් තැන්හි මහිමය ද වේ වා!"යි කී හ. එවිට සමූහයා අතරෙන් සමහර පරිසිවරු, "ගුරුදේවයෙනි, ඔබගේ ශ්‍රාවකයන්ට තරවටු කළ මැනවැ"යි උන් වහන්සේට කී හ. උන් වහන්සේ උත්තර දෙමින්, "ඔවුන් නිහඬ වූවොත්, ගල්, මොරගසනු ඇතැ යි මම ඔබට කියමි"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

### පෙරහැර සඳහා ගීතිකාව

ක්‍රිස්තු රජාණන්ට ස්තෝත්‍ර වේවා සෑම කල්හී ජය වේවා
හෝසන්නා /// ක්‍රිස්තු රජාණෙනී....

දෙවියන් වහන්සේගේ නාමයෙන් පැමිණෙන තැනැත්තාණෝ
සදාකාලයටම ආරාධිත වේවා....

ස්වාමිනී, අපි ඔබවහන්සේට නමස්කාර කරමු
අපි ඔබවහන්සේට සේවය කිරීමට කැප වන්නෙමු....

ජේසුනී අපේ ගැළැවුම් කාරයාණෙනී
අපේ හෘදයන් තුළ ඔබ ආණ්ඩු කරන සේක්වා....

ජේසුස් ක්‍රිස්තුනී දේව කුමාරයාණෙනී
අප හෘදයන්හි ඔබ රජකම් කරන සේක්වා....

## <u>පළමුවන කියැවීම</u> ඉසයියස් 50:4-7

ඉසයියස් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයකි.

**මාගේ මුහුණ නින්දවලින් ඉවත හරවා නොගතිමි.**

විඩාවට පත්වූවන් ශක්තිමත් කරන පිණිස ගුරුවරයෙකු මෙන් මා කිව යුතු දේ ගැන සිසුවෙකු මෙන් එතුමන්ට සවන් දෙනු පිණිස, මහෝත්තම දෙවි සමිඳාණෝ හැම උදයකම මා තුළ උනන්දුවක් ඇති කරවන සේක. දෙවි සමිඳුන් මාගේ කන් පහදා ඇත. මා එතුමන්ට විරුද්ධව කැරළි ගැසුවේ වත් එතුමන්ට පිටුපා ගියේවත් නැත. මට පහර දෙන්නන්ට මම මාගේ පිට පෑවෙමි. මාගේ රැවුල් ගස් උදුරන්නන්ට මම මුහුණ දුන්නෙමි. මාගේ මුහුණ නින්දවෙනුත් කෙළ ගැසීමෙනුත් හරවා නොගතිමි. මහෝත්තම දෙවි සමිඳාණන් මට උපකාර කරන බැවින් මම වියවුල් නොවන්නෙමි. මම නිර්භීත ලෙස මුහුණ පාන්නෙමි. මා ලජ්ජාවට නොපැමිණෙන බව දනිමි.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## <u>පිළිතුරු ගීය</u> ගීතාවලිය 22:7-8, 16-19, 22-23

පිළිතුර: මාගේ දෙවියනී, මාගේ දෙවියනී, ඔබ මා අත්හැරියේ මන්ද?

ගීය: සියල්ලෝ මා දෙස බලා, කවටකම් කරති. දත නියවා, හිස වනා මෙසේ කියති. "සමිඳුන්ට ඔහු භාරවිණි. එතුමන් ඔහු ගළවා නොගන්නේ මන්ද? සමිඳුන්ට ඔහු ප්‍රියමනාප විණි. එතුමන් ඔහු මුදා නොගන්නේ මන්ද?"

මන්ද, නපුරු මිනිස්සු බලු රැළක් මෙන් මා වට කර ගත්තෝ ය. මැරවරයෝ මා වටලා ගත්තෝ ය. ඔව්හු මාගේ දෑත් දෙපා සිදුරු කළෝ ය. මාගේ ඇටකටු ගණන් කළ හැකි තරමට පෑදී ඇත. සතුරෝ මා දෙස රවා ඔරවා බලති.

මාගේ වස්ත්‍ර තම තමන් අතර බෙදා ගනිති. මාගේ සළුව ගැනීමට දාදු දමති. හිමි තුමාණෙනී, මා හැරදමා ඈත් නොවනු මැනවි. මාගේ බලය වන ඔබ මට පිහිට වන්නට කඩිනම් වුව මැනව.

ඔබේ නාමය මාගේ සහෝදරයන්ට ප්‍රකාශ කරන්නෙමි. බැතිමතුන්ගේ සභාවේදී ඔබට ප්‍රශංසා කරන්නෙමි. හිමි සඳාණන්ට ගරු බිය ඇත්තෙනි, එතුමන් පසසන්න. ජාකොබ් වංශයේ සියල්ලෙනි, එතුමන්ට ගෞරවය දෙන්න. ඊශ්‍රායෙල් වංශයේ සියල්ලෙනි, එතුමන්ට ගරු බුහුමන් කරන්න.

## <u>දෙවන කියැවීම</u> පිලිප්පි 2:6-11

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් පිලිප්පිවරුන්ට ලියන ලද හසුනෙන් උපුටාගත් කොටසකි.

**ජේසුස් වහන්සේ යටහත් පහත් වූ හෙයින් සියල්ලට වඩා උසස් කරනු ලැබූ සේක.**

ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ස්වරූපය දරූ නමුත්, දෙවියන් වහන්සේ හා සමානත්වය තමන් විසින් බදාගෙන ම තබාගත යුතු වස්තුවකැයි නොසිතා, එය ඉවතලා, සේවකයකුගේ ස්වරූපයක් ගෙන, අප හා සමාන මිනිස් කෙනෙක් වූ සේක. මනුෂ්‍යාකාරයෙන් සිටිමින් උන්වහන්සේ මරණය, එනම් කුරුසියේ මරණය දක්වා පහත් වී කීකරු වූ සේක. එබැවින් දෙවියන් වහන්සේ උන්වහන්සේ

අති උසස් තැනට නංවා, සියලු නාමයන්ට වඩා අග්‍රනාමය උන්වහන්සේට දුන් සේක. එසේ කළේ ස්වර්ගයෙහිද, පොළොවෙහිද, පාතාල ලෝකයෙහිද සියල්ලන්, ජේසුස් යන නාමයට දණ නමන පිණිසත්, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ස්වාමින් වහන්සේ යයි දෙවි පියාණන් වහන්සේගේ මහිමය සඳහා සෑම දිවකින්ම ප්‍රකාශ කරන පිණිසත්ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** පිලිප්පි 2:8-9

ක්‍රිස්තුස් වහන්සේ මරණය දක්වා එනම් කුරුසියේ මරණය දක්වා පහත් වී කීකරු වූ සේක. එබැවින් දෙවියන් වහන්සේ උන්වහන්සේ අති උසස් තැනට නංවා, සියලු නාමයන්ට වඩා අග්‍රනාමය උන්වහන්සේට දුන් සේක.

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ලූක් 22:14-23:56

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**සුවිශේෂක ලූක් තුමන් විසින් ලියා තිබෙන අයුරෙන් අප ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුඃඛ ප්‍රාප්තිය මෙසේය.**

නියම වේලාව පැමිණි කල, උන් වහන්සේ කෑමට හිඳගත් සේක. ප්‍රේරිතයෝ ද උන් වහන්සේ සමග හිඳගත්හ. උන් වහන්සේ ඔවුන්ට කතා කොට, "මා වද විඳීමට පළමුවෙන්, මේ පාස්කු භෝජනය ඔබ සමග වළඳන්නට අතිශයින් ආශා වීමි. ඒ මන්ද යි මම ඔබට කියමි, දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ දී එය මුදුන්පත් වනතුරු මම එය තවත් නොවළඳමි"යි වදාළ සේක. උන් වහන්සේ කුසලානක් ගනිමින්, තුති පුද, "මෙය ගෙන ඔබ අතරෙහි බෙදාගන්න. මන්ද, මම ඔබට කියමි, මෙතැන් පටන්, දෙවියන් වහන්සේගේ රාජ්‍යය පැමිණෙන තුරු, මම මිදියුස පානය නො කරන්නෙමි"යි වදාළ සේක. උන් වහන්සේ රොටි ගෙන තුති පුද, ඒවා කඩා, ඔවුන්ට දී, "ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරය මේ ය. මා සිහි කිරීම පිණිස මෙය කරන්නැ"යි වදාළ සේක. එලෙස ම භෝජනයෙන් පසු කුසලාන දී, "මේ කුසලාන ඔබ උදෙසා වගුරුවනු ලබන මාගේ රුධිරයෙන් කළ නව ගිවිසුම ය. එහෙත්, දැන් මා පාවා දෙන්නාගේ අත මාළඟින් ම මේසය මත තිබේ. මන්ද, මනුෂ්‍ය-පුත්‍රයාණෝ නියමිත ගමන යන සේක් ම ය. එහෙත්, ඔහු පාවා දෙන ඒ මනුෂ්‍යයාට වන විපතක මහතැ"යි උන් වහන්සේ වදාළ සේක. එවිට එය කරන්නට යන්නේ ඔවුන්ගෙන් කවරෙක් දැ යි ඔව්හු තම තමන් අතර විමසන්නට පටන්ගත්හ.

තමන් අතරෙන් ශ්‍රේෂ්ඨතම ලෙස සැලකිය යුත්තේ කවරෙක් දැ යි ශ්‍රාවකයන් අතර විවාදයක් ඇති විය. උන් වහන්සේ ඔවුන්ට මෙසේ වදාළ සේක: "විජාතීන්ගේ රජවරු වැසියන් කෙරෙහි අධිපති බලය පාන්නාහ. ඔවුන් කෙරෙහි බලය පවත්වන්නෝ ජාති හිතෛෂීහු යයි කියනු ලබති. එහෙත් ඔබ අතර එය එසේ නොවේ. ඔබ අතර ශ්‍රේෂ්ඨ තැනැත්තා ඉතා සුළු තැනැත්තා මෙන් ද නායකයා සේවකයා මෙන් ද වේ වා. වඩා උතුම් කවරේ ද, කෑමට හිඳින තැනැත්තා ද, නැතහොත් සේවකයා ද? කෑමට හිඳින තැනැත්තේ නොවේ ද? එහෙත්, මම නම්, ඔබ මැද සේවකයා මෙන් වෙමි. මාගේ පරීක්ෂාවල දී මා සමග සිටි අය ඔබ ම ය. එබැවින් මාගේ පියාණන් වහන්සේ මට රාජ්‍යය පවරා දුන් සේ ම, මාගේ

රාජ්‍යයෙහි මාගේ මේසයේ දී කන බොන පිණිස ද සිහසුන් අරා ඉශ්රායෙල් ගෝත්‍ර දෙළොස කෙරෙහි විනිශ්චය කරන පිණිස ද වරය මමත් ඔබට පවරා දෙමි."

"සීමොන්, සීමොන්, මෙය අසන්න. තිරිඟු පොළන්නාක් මෙන් ඔබ සියලු දෙන පොළාලන්නට සාතන් අවසර ලබා ඇත. එහෙත්, ඔබේ ඇදහිල්ල නොබිඳෙන පිණිස ඔබ උදෙසා මම යාච්ඤා කෙළෙමි. ඔබ යළිත් හැරුණු පසු, ඔබේ සහෝදරයන් ධෛර්යවත් කරන්නැ"යි වදාළ සේක. ඔහු උත්තර දෙමින්, "ස්වාමීනි, ඔබ හා සමඟ හිරේ යාමට හා මරණයට වුව ද මම සූදානම් ව සිටිමි"යි උන් වහන්සේට කී ය. ජේසුස් වහන්සේ කතා කරමින්, "පේදුරු, මම මෙය ඔබට කියමි, ඔබ මා නොදන්නා බව තුන් වරක් කියන තුරු, අද රෑ කුකුළා නොහඬලන්නේ ය"යි වදාළ සේක.

උන් වහන්සේ ඔවුන්ට වදාරමින්, "පසුම්බියක් වත්, මල්ලක් වත්, පා වහන් වත් නැති ව මා ඔබ යැවූ කල කිසිවක් හිඟ වී ද"යි ඇසූ සේක. ඔව්හු උත්තර දෙමින්, "නැතැ"යි කී හ. උන් වහන්සේ ඔවුන්ට කතා කොට, "එහෙත් දැන් පසුම්බියක් ඇති තැනැත්තා එය ගනී වා, එසේ ම මල්ලක් ද ගනී වා, කඩුවක් නැති තැනැත්තා තම සළුව විකුණා, කඩුවක් මිළ දී ගනී වා. මම මෙය ඔබට කියමි, 'උන් වහන්සේ අපරාධකරුවන් සමඟ ගණන් ගනු ලැබී ය'යි ලියා තිබෙන ඒ කීම මා තුළින් මුදුන් පත් විය යුතු ය. මා ගැන ලියා ඇති දෙය සම්පූර්ණ වන්නේ ම ය"යි වදාළ සේක. ඔව්හු කතා කරමින්, "ස්වාමීනි, බැලුව මැනව, කඩු දෙකක් මෙහි ඇතැ"යි කී හ. උන් වහන්සේ ද: "ඔය ඇති"යි වදාළ සේක.

එවිට ජේසුස් වහන්සේ පිටත් ව සිරිත් පරිදි ඔලීව කන්දට වැඩිය සේක. ශ්‍රාවකයෝ ද උන් වහන්සේ පසුපස්සේ ගියහ. උන් වහන්සේ එහි පැමිණි පසු කතා කොට, "ඔබ පරීක්ෂාවට නොවැටෙන ලෙස යාච්ඤා කරන්නැ"යි වදාළ සේක.ගලක් ගසන තරම් දුරක් උන් වහන්සේ ඔවුන්ගෙන් ඈත් වී, දණින් හිඳ යාච්ඤා කරමින්, "පියාණෙනි, ඔබ කැමැති සේක් නම්, මේ කුසලාන මාගෙන් පහ කළ මැනව. එහෙත්, මාගේ කැමැත්ත නොව ඔබේ කැමැත්ත වේ වා"යි වදාළ සේක. එකල දේව දූතයෙක් ස්වර්ගයෙන් පහළ වී, උන් වහන්සේ ශක්තිමත් කෙළේ ය. උන් වහන්සේ දැඩි සිත් වේදනාවෙන් පෙළුණු සේක්, වඩාත් ඕනෑකමින් යාච්ඤා කළ සේක. උන් වහන්සේගේ ඩාදිය ලේ බින්දු මෙන් බිම වැටිණි. උන් වහන්සේ යාච්ඤා කරමින් සිට නැඟිට, ශ්‍රාවකයන් වෙත අවුත්, ඔවුන් ශෝකය නිසා නිඳා හිඳිනු දැක, "ඔබ නිඳා ඉන්නේ මන් ද? පරීක්ෂාවට නොවැටෙන පිණිස නැඟිට යාච්ඤා කරන්නැ"යි ඔවුන්ට වදාළ සේක.

උන් වහන්සේ මෙවදන් පවසත් ම සමූහයක් පැමිණියහ. දෙළොස් දෙනාගෙන් එක් කෙනෙක් වූ ජූදස් නමැත්තා ඔවුන්ට පෙරටුව අවුත්, ජේසුස් වහන්සේ සිඹින පිණිස උන් වහන්සේ වෙතට ළං විය. ජේසුස් වහන්සේ ද "ජූදස්, ඔබ සිඹීමකින් මනුෂ්‍ය-පුත්‍රයාණන් පාවා දෙන්නෙහි ද"යි ඇසූ සේක. උන් වහන්සේ සමඟ සිටි අය සිදු වන්න යන දෙය දැක, "ස්වාමීනි, කඩු පහරක් දෙමු ද"යි උන් වහන්සේගෙන් ඇසූ හ. ඔවුන්ගෙන් එක් කෙනෙක් උත්තම පූජකයාගේ දාසයාට ගසා, ඔහුගේ දකුණු කන කපා දැමී ය. එහෙත් ජේසුස් වහන්සේ, "ඔය ඇති, නවතින්න," කියා ඔහුගේ කන අතගා සුව කළ සේක. ජේසුස් වහන්සේ තමන්ට විරුද්ධ ව ආ නායක පූජකයන්ට ද දේව මාලිගාවේ මුර සෙබළුන්ට ද ප්‍රජා මූලිකයන්ට ද කතා කොට, "ඔබ සොරෙකු හා සටනට මෙන් කඩු මුගුරු රැගෙන ආවාහු ද? දිනපතා මා දේව මාලිගාවෙහි ඔබ හා සමඟ සිටිය දී ඔබ මට විරුද්ධ ව අත් එසෙව්වේ නැත.

එහෙත් මෙය ඔබගේ අවස්ථාව ය. අන්ධකාරය රජ කරන මොහොත ය"යි වදාළ සේක.

ඔව්හු ජේසුස් වහන්සේ අල්ලාගෙන උත්තම පූජකයාගේ මැදුරට ගෙන ගියහ. පේදුරු ද ඈතින් පසුපස්සේ ගියේ ය. ඔවුන් මළුව මැද ගිනි මැලයක් ගසා එක් ව හිඳගෙන සිටිය දී, පේදුරු ඔවුන් මැද හිඳගත්තේ ය. එවිට එක් සේවිකාවක් ඔහු ගිනි මැලය ළඟ සිටිනු දැක, ඔහු දෙස හොඳට බලා, "මේ මිනිසාත් ඔහු සමඟ සිටියේ ය"යි කීවා ය. "ස්ත්‍රිය, නැත. මම ඔහු නාඳුනමි"යි පේදුරු කී ය. මඳ වේලාවකට පසු තවත් කෙනෙක් ඔහු දැක, "ඔබත් ඔවුන්ගෙන් එක් කෙනෙක් ය"යි කී ය. පේදුරු පිළිතුරු දෙමින්, "නැත, නැත, එසේ නොවේ ය"යි කී ය. පැයකට පමණ පසු තවත් කෙනෙක් කතා කොට, "ඇත්තෙන් ම මොහුත් ඔහු සමඟ සිටියේ ය. මන්ද, මොහු ගලීලයෙකැ"යි තරයේ ම කියා සිටියේ ය. පේදුරු ද, "ඔබ කියන දේ මට නොතේරේ" යයි කී ය. එකෙණෙහි ම, ඔහු කතා කරද්දී ම, කුකුළෙක් හැඬලී ය. සමිඳුණන් වහන්සේ හැරී පේදුරු දෙස බැලූ සේක. පේදුරු ද, "අද කුකුළා හඬලන්නට පළමුවෙන් 'ඔහු නාඳුනමි'යි තුන් වරක් ඔබ මා ගැන කියන්නෙහි ය"යි සමිඳුණන් වහන්සේ ඔහුට පැවසූ කීම සිහි කොට, පිටතට ගොස්, දැඩි දුකින් හැඬී ය.

එකල ජේසුස් වහන්සේ අල්ලාගෙන සිටි මනුෂ්‍යයෝ උන් වහන්සේට කවට කම් කරමින් පහර දුන්හ. ඔව්හු ජේසුස් වහන්සේගේ ඇස් වසා බැඳ, "ඔබට ගැසුවේ කවරෙක් ද කියා දිවැසින් කියන්නැ"යි උන් වහන්සේට කී හ. ඔව්හු තවත් බොහෝ දේ උන් වහන්සේට විරුද්ධ ව කියමින්, අපහාස කළහ.

පහන් වූ කෙණෙහි ම, නායක පූජකයන් ද විනයධරයන් ද ඇතුළු ප්‍රජා මූලිකයන්ගේ සංගමය රැස් ව, සිය ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට උන් වහන්සේ ගෙන ගොස්, "ඔබ ක්‍රිස්තුස් ද? අපට කියන්නැ"යි කී හ. උන් වහන්සේ පිළිතුරු දෙමින්, "මා ඔබට කීවත් ඔබ විශ්වාස කරන්නේ නැත. මා ඔබගෙන් ඇසුවත් ඔබ පිළිතුරු දෙන්නේ නැත. එහෙත් මෙතැන් පටන් මනුෂ්‍ය-පුත්‍රයාණන් දෙවියන් වහන්සේගේ බල-පරාක්‍රමයේ දකුණු පස වැඩහිඳිනු ඇතැ"යි ඔවුන්ට වදාළ සේක. ඔව්හු සියල්ලෝ, "එසේ නම් ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ දැ"යි ඇසූ හ. උන් වහන්සේ ද, "මා එසේ බැව් පවසන්නේ ඔබ ම ය"යි වදාළ සේක. ඔව්හු ද, "වෙන සාක්කියක් අපට කුමට ද? මෙය ඔහුගේ ම කටින් කියනවා අපගේ ම කණින් ඇසීමු"යි කී හ.

එවිට ඒ මුළු සමූහයා නැඟිට, උන්වහන්සේ පිලාත් ඉදිරියට ගෙන ගියහ. ඔව්හු උන් වහන්සේ ගැන චෝදනා කරන්නට පටන්ගෙන, "මොහු අපේ ජාතිය කැරලිගැසීමට පොළඹවන බවත්, අධිරාජයාට අයබදු දීම තහනම් කරන බවත්, තමා ක්‍රිස්තුස් නම් රජෙක් යයි කියාගන්න බවත් අපි දැනගතිමු"යි කී හ. පිලාත් කතා කරමින්, "ඔබ ජුදෙව්වරුන්ගේ රජු දැ"යි උන් වහන්සේගෙන් ඇසී ය. "එසේ කියන්නේ ඔබ ය"යි උන් වහන්සේ වදාළ සේක. එවිට පිලාත් නායක පූජකයන්ට ද සමූහයන්ට ද කතා කොට, "මේ මනුෂ්‍යයා අත කිසි වරදක් මට නොපෙනේ ය"යි කී ය. එහෙත් ඔව්හු පිළිතුරු දෙමින්, "මොහු ගලීලයේ සිට මෙතැන දක්වා ජුදය මුළුල්ලෙහි උගන්වමින් සෙනඟ කළඹන්නේ ය"යි තරයේ ම කියා සිටියහ.

පිලාත් ඒ අසා, "මේ මනුෂ්‍යයා ගලීලයෙක් දැ"යි විචාළේ ය. එවිට පිලාත් උන් වහන්සේ හෙරොද්ගේ ප්‍රදේශයට අයිති බව දැන, හෙරොද් ඒ දවස්වල ජෙරුසලමෙහි සිටි බැවින්, උන් වහන්සේ ඔහු වෙත යැවී ය. හෙරොද් ජේසුස්

වහන්සේ දැක, ඉතා සන්තෝෂ විය. මන්ද, ඔහු උන් වහන්සේ ගැන අසා සිටි බැවින් බොහෝ කලෙක පටන් උන් වහන්සේ දකින්න ආශාවෙන් සිටියේ ය. උන් වහන්සේ යම් ආශ්චර්යයක් කරනු දැකීමට ද ඔහු බලාපොරොත්තු විය. ඔහු උන් වහන්සේගෙන් බොහෝ ප්‍රශ්න ඇසූ නමුත් උන් වහන්සේ කිසි පිළිතුරක් නුදුන් සේක. නායක පූජකයෝ ද විනයධරයෝ ද නැඟිට, උන් වහන්සේට තදින් වරද තැබූ හ. හෙරොද් තමාගේ සෙබළුන් සමඟ උන් වහන්සේ හෙළා දකිමින් සරදම් කොට, විචිත්‍ර වස්ත්‍රයක් හඳවා, උන් වහන්සේ පිලාත් වෙත පෙරළා යැවී ය. ඊට පෙර, කාලයක් ම මේ දෙදෙනා විරුද්ධවාදී ව සිටියත් ඒ දවසේ ම මිත්‍ර වූහ.

පිලාත් නායක පූජකයන් ද ප්‍රධානීන් ද සෙනඟ ද රැස් කරවා, ඔවුන්ට කියනුයේ, "ඔබ මේ මනුෂ්‍යයා සෙනඟ කැරලිගැසීමට පොළඹවන්නෙකැ යි කියා මා වෙත ගෙනාවහු ය. බලන්න, ඔබ ඉදිරියෙහි මා ඔහු විභාග කළ විට, ඔබ විසින් මොහුට විරුද්ධ ව කළ චෝදනාවලින් කිසිවක් ගැන ඔහු වරදකාරයෙකැ යි මට පෙනුණේ නැත. හෙරොද්ට ද පෙනුණේ නැත. හෙරොද් මොහු නැවත අප වෙත එවූයේ ඒ නිසා ය. බලන්න, මරණීය දණ්ඩනයට සුදුසු කිසිවක් ඔහු කර නැත. එබැවින් මම ඔහුට තළා නිදහස් කොට හරිමි"යි කී ය. එසේ කීවේ පාස්කු මංගල්‍යයක දී එක මිනිසකු නිදහස් කර දීමට ඔහු බැඳී සිටි බැවිනි. එහෙත් සියල්ලෝ ම, "මොහු මරාදමන්න, බරබ්බස් අපට නිදහස් කර දෙන්නැ"යි එක හඬින් මොරගැසූ හ. බරබ්බස් වනාහි නගරයේ සිදුවූ කැරලිගැසීමක් ද මිනී මැරීමක් ද නිසා හිරගෙට යවනු ලැබූවෙකි. පිලාත් ජේසුස් වහන්සේ මුදා හැරීමට කැමැති ව නැවතත් ඔවුන්ට කතා කෙළේ ය. එහෙත් ඔව්හු, "මොහු කුරුසියෙහි ඇණ ගසන්න! කුරුසියෙහි ඇණ ගසන්න!" කියා මොරගැසූ හ. ඔහු තෙ වන වරටත් කතා කොට, "කිමෙක් ද? මොහු කවර අපරාධයක් කෙළේ ද? මොහු අත මරණීය දණ්ඩනයට සුදුසු කිසිවක් නැත. එබැවින් මොහුට තළා මුදා හරිමි"යි කී ය. එහෙත්, උන් වහන්සේ කුරුසියෙහි ඇණ ගසන ලෙස ම ඉල්ලා ඔව්හු වැඩි වැඩියෙන් මොරගැසූ හ. ඔවුන්ගේ උද්ඝෝෂණය සාර්ථක විය. පිලාත් ඔවුන්ගේ ඉල්ලීම පරිදි තීන්දුව දුන්නේ ය.තවද, ඔහු කැරලිගැසීම හා මිනී මැරීම නිසා හිර ගෙයි දමා සිටි, සෙනඟ ඉල්ලූ තැනැත්තා මුදා හැරියේ ය. එහෙත් ඔහු ජේසුස් වහන්සේ ඔවුන්ගේ හිතුමනාපයට පාවා දුන්නේ ය.

ඔව්හු උන් වහන්සේ ගෙන යන කල, පිටිසරින් පැමිණි සිරේනියේ සීමොන් නම් මනුෂ්‍යයෙකු අල්ලාගෙන, ජේසුස් වහන්සේ පසුපස්සෙන් කුරුසිය දරාගෙන යන පිණිස එය ඔහු පිට තැබූ හ. පොදු ජනයාගෙන් ද උන් වහන්සේ නිසා හඬා වැලපෙන ස්ත්‍රීන්ගෙන් ද යුක්ත වූ විශාල පිරිසක් උන් වහන්සේ පසුපස්සේ, ගමන් ගත්හ. ජේසුස් වහන්සේ ඔවුන් දෙසට හැරී, "ජෙරුසලමේ දූවරුනි, මා නිසා නොහඬන්න, ඔබ සහ ඔබේ දරුවන් නිසා ම හඬන්න. වඳ ස්ත්‍රීහු ද කිසි කලෙක දරුවන් නොදැරූ කුස ද කිරි නුදුන් පියයුරු ද භාග්‍යවන්ත යයි පවසන දවස් පැමිණෙන්නේ ය. ඒ දවස්වල දී ඔව්හු කඳු අමතා, 'අප පිට වැටෙන්න' හෙල් අමතා, 'අප වසාගන්නැ'යි කියන්න පටන්ගන්නෝ ය. මන්ද, ඔව්හු අමු ගසට මේ දේ කරත් නම්, වියළුණු ගසට කුමක් නො කරනු ඇද්ද"යි වදාළ සේක.

මරණ දඬුවමට වරදකරුවන් වූ තවත් දෙදෙනෙක් ද උන් වහන්සේ සමඟ ගෙන යන ලදහ. ඔව්හු කපාලපිටිය නම් ස්ථානයට පැමිණ, එහි දී උන් වහන්සේ

කුරුසියෙහි ඇණ ගැසූ හ. වරදකරුවන්ගෙන් එක් කෙනෙකු උන් වහන්සේගේ දකුණු පස ද, අනික් එක්කෙනා වම් පස ද කුරුසිවල ඇණ ගැසූ හ. ජේසුස් වහන්සේ කතා කොට, "පියාණෙනි, ඔවුන්ට කමා වුව මැනව. ඔවුන් කරන දෙය ඔව්හු නොදනිති"යි වදාළ සේක. ඔව්හු උන් වහන්සේගේ වස්ත්‍ර බෙදාගැනීම පිණිස දාදු දැමූ හ. සෙනඟ ද බලාගෙන සිටියහ. ප්‍රධානීහු උන් වහන්සේට ගැරහුම් කරමින්, "මොහු අනුන් ගැළවීය. මොහු දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුස් නම්, උන් වහන්සේගේ තෝරාගත් තැනැත්තේ නම්, තමා ම ගළවා ගනීවා"යි කී හ. මුර සෙබළෝ ද උන් වහන්සේ ළඟට අවුත් උන් වහන්සේට කාඩි පිළිගන්වා, 'ඔබ ජුදෙව්වරුන්ගේ රජු නම්, ඔබ ඔබ ම ගළවාගන්න" කියා සරදම් කළහ. "ජුදෙව්වරුන්ගේ රජ මොහු ය"යි කියා ලියන ලද පුවරු කඩක් උන් වහන්සේට ඉහළින් තබා තිබිණි.

එල්ලා සිටි වරදකරුවන්ගෙන් එක් කෙනෙක් උන් වහන්සේට අපහාස කරමින්, "ඔබ ක්‍රිස්තුස් නොවේ ද? ඔබ වත් ගළවාගෙන අප වත් ගළවා ගන්නැ"යි කී ය. අනෙකා ඔහුට තරවටු කරමින්, එම දඬුවමට පැමිණ සිටින ඔබ දෙවියන් වහන්සේට වත් බිය නැද් ද? අපට දඬුවම් ලැබීම සාධාරණ ය: අපට මේ ලැබෙන්නේ අපේ ක්‍රියාවලට සුදුසු විපාක හැටියට ය. එහෙත්, මේ තැනැත්තා කිසි ම වරදක් කර නැතැ"යි උත්තර දුන්නේ ය.තවද ඔහු, "ජේසුස් වහන්ස, ඔබ රාජශ්‍රීයෙන් වඩිනා කල මා සිහි කළ මැනවැ"යි කී ය. උන් වහන්සේ ද, කතා කරමින් "ඇත්තෙන් ම මම ඔබට කියමි, ඔබ මා සමග අද ම පාරාදීසයෙහි සිටින්නෙහි ය"යි වදාළ සේක.

එය මද්දහන් වේලාව පමණ විය. රට පුරා අන්ධකාරයක් පහළ වී, එය සවස තුන දක්වා පැවතිණි. හිරු අඳුරු විය. දේව මාලිගාවේ තිරය දෙකඩ ව ඉරී ගියේ ය. ජේසුස් වහන්සේ මහ හඬින් මොරගසා, "පියාණෙනි, ඔබ හස්තයට මාගේ ආත්මය භාර දෙමි"යි වදාළ සේක. මෙවදන් කියා උන් වහන්සේ අවසන් හුස්ම හෙළූ සේක. එවිට ශතාධිපතියා සිදු වූ දෙය දැක දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින්, "සැබැවින් ම මේ මනුෂ්‍යයා නිදෙස් කෙනෙකැ"යි කීවේ ය. මේ සිද්ධිය බැලීමට ආ සමූහයා සිදු වූ සියල්ල දැක, ළයට ගසාගනිමින් ආපසු ගියහ. උන් වහන්සේ දන හැඳින සිටි සියල්ලෝ ද ගලීලයේ සිට උන් වහන්සේ සමඟ ආ ස්ත්‍රීහු ද ඒ දේ නරඹමින් දුරින් සිටියහ.

ජුදෙව් නුවරක් වූ අරිමාතියෙන් පැමිණි ජෝසෙප් නම් මනුෂ්‍යයෙක් විය. ඔහු යහපත් දැහැමි තැනැත්තෙකි. ජුදා මන්ත්‍රණ සභාවෙහි ගරුතර සාමාජිකයෙකි. ඔහු ජුදෙව්වරුන්ගේ තීරණය හා ක්‍රියා කලාපය අනුමත නොකෙළේ ය. ඔහු දෙවියන් වහන්සේගේ රාජ්‍යය පිළිබඳ අපේක්ෂාවෙන් සිටියේ ය. ඔහු පිලාත් වෙත ගොස් ජේසුස් වහන්සේගේ මෘත දේහය ඉල්ලී ය. ඔහු එය පහතට ගෙන, සිහින් හණ රෙද්දකින් වෙළා, ඒ දක්වා කිසිවකු නොතැබූ, ගලක කණින ලද සොහොනක උන් වහන්සේ තැන්පත් කෙළේ ය. ඒ දවස සබත් දිනයට සූදානම් වීමේ දවස වන සිකුරාදා විය.ගලීලයේ සිට උන් වහන්සේ සමග ආ ස්ත්‍රීහු ගොස්, සොහොන් ගෙය ද උන් වහන්සේගේ මෘත දේහය තැන්පත් කළ අන්දම ද බලාගත්හ. ඔව්හු ආපසු අවුත් සුගන්ධ ද්‍රව්‍ය හා විලේපන සූදානම් කළහ.

ව්‍යවස්ථාවට අනුකූල ව ඔව්හු සබත් දවසේ නිවාඩු ගත්හ.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.